# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2469/08 - 2025 දෙසැම්බර් මස 30 වැනි අඟහරුවාදා - 2025.12.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති**
**අනුර කුමාර දිසානායක මැතිතුමන් විසිනි**

මුද්‍රාව

අනුර කුමාර දිසානායක.

1. **නීතීඥ පියසේන රණසිංහ මැතිතුමා**
   **හිටපු මහාධිකරණ විනිසුරු**
2. **ඊ.ආර්.එම්.එස්.එච්. ඒකනායක මැතිතුමා**
   **ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - I ශ්‍රේණිය**
3. **ඩී.එස්. වික්‍රමසිංහ මැතිතුමා**
   **හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී**

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

පසුගිය දශක ගණනාවක් පුරා කොළඹ මහ නගර සභාවට අයත් ඉඩම්, ගොඩනැගිලි ඇතුළු සියලු දේපළ සම්බන්ධයෙන් ද නගර සභාව මගින් සිදු කරන සැපයුම්, සේවා, ව්‍යාපෘති සහ විවිධ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ද සිදු වී ඇතැයි කියනු ලබන දූෂණ ක්‍රියා, වංචා, සාපරාධී ලෙස විශ්වාසය කඩ කිරීම, දේපළ සාපරාධී  ව්‍යපහරණය, රැවටීම, බලය හෝ අධිකාරය, රාජ්‍ය සම්පත් හා වරප්‍රසාද අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ අවභාවිතය සම්බන්ධයෙන් දේශපාලන පදවි දැරූ හෝ තවදුරටත් දරමින් සිටින පුද්ගලයන්ට සහ රජයේ සේවකයන් වශයෙන් සහ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් වශයෙන් සේවයේ නිරතව සිටි හෝ තවදුරටත් සේවයේ නිරතව සිටින පුද්ගලයන්ට සහ සේවා සහ සැපයීම් සිදු කරන පුද්ගලයන්ට එරෙහිව පැමිණිලි සහ චෝදනා විශාල සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇති හෙයින්ද,

1A - PG 7440 — 358 (2025/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත කී සිදුව ඇතැයි කියනු ලබන වංචා දූෂණ ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය වත්කමට හා ආදායමට බරපතල අලාභ හෝ හානි සිදු වීම මෙන්ම කොළඹ මහ නගර සභාව අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී ඇති හෙයින්ද,

මෙම පැමිණිලි චෝදනා හා තොරතුරුවල සත්‍යතාවය නිශ්චය වශයෙන් සොයා දැන ගැනීමේ අරමුණෙන් එකී පැමිණිලි, චෝදනා හා තොරතුරු සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම හා විමර්ශනය කිරීම අවශ්‍යව ඇති හෙයින් ද,

ඉහත කී ක්‍රියා සඳහා වගකිවයුතු තැනැත්තන් හෝ ආයතන වෙතොත් ඔවුන් හඳුනාගැනීමට අවශ්‍යව ඇති හෙයින් ද,

එවැනි ක්‍රියාවන් ඉදිරියේ දී යලි සිදු නොවීමට සහතික කරගනු පිණිස කවර ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතුද යන වග නිශ්චය කර ගැනීම ජාතියේ යහපත පිණිස අත්‍යාවශ්‍ය කාරණයක් බව මගේ මතය වන හෙයින් ද,

ඉහත කී වරදවල් හා වැරදි ක්‍රියා පිළිබඳ විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කළ යුතු යැයි මා අදහස් කරන හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අනුර කුමාර දිසානායක වන මම ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථය, ස්වාධීනතාවය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, සංශෝධිත (393 අධිකාරය වන) 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත කී,

1. **නීතිඥ පියසේන රණසිංහ මැතිතුමා**
   **හිටපු මහාධිකරණ විනිසුරු**
2. **ඊ.ආර්.එම්.එස්.එච්. ඒකනායක මැතිතුමා**
   **ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - I ශ්‍රේණිය**
3. **ඩී.එස්. වික්‍රමසිංහ මැතිතුමා**
   **හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී**

වන ඔබතුමන්ලා, මතු දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කොට පරීක්ෂාකොට වාර්තා කරනු පිණිස මාගේ කොමසාරිස්වරුන් ලෙස මෙයින් පත් කරමි.

1. 2010 සිට 2025 දක්වා කාලය තුළ කොළඹ මහ නගර සභාව තුළ සිදු වී ඇතැයි සැලකෙන දූෂණ ක්‍රියා, වංචා, සාපරාධී ලෙස විශ්වාසය කඩ කිරීම, දේපළ සාපරාධී ව්‍යපහරණය, රැවටීම සහ බලය හෝ අධිකාරය, රාජ්‍ය සම්පත් හා වරප්‍රසාද අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ අවභාවිතය, නීත්‍යානුකූල නොවන බඳවා ගැනීම් හා පත් කිරීම්, නීති විරෝධී සැලසුම්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය කිරීම්, නිශ්චල හෝ චංචල දේපළ කුලියට හෝ බද්දට දීමේදී සිදුකර ඇති අක්‍රමිකතා, නිසි කාර්යය පටිපාටියෙන් බැහැරව සිදු කර ඇති නඩු කටයුතු, සමථ කිරීම් හා බේරුම් කිරීම් සහ එකී වරදවල් සහ වැරදි ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය වත්කම් වලට රාජ්‍ය ආදායමට බරපතල අලාභ හෝ හානි සිදු වීම සම්බන්ධයෙන් දේශපාලන පදවි දැරූ හෝ තවදුරටත් දරමින් සිටින පුද්ගලයන්ට සහ රජයේ සේවකයන් වශයෙන් සහ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් වශයෙන් සේවයේ නිරතව සිටි හෝ තවදුරටත් සේවයේ නිරතව සිටින පුද්ගලයන්ට සහ සේවා සහ සැපයීම් සිදු කරන පුද්ගලයන්ට සහ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන හෝ පුද්ගලයන්ට එරෙහි බරපතල චෝදනා පිළිබඳව මහජන පැමිණිලි, තොරතුරු සහ සෙසු කරුණු කැඳවීම හා ලබා ගැනීම. මෙකී කාර්යය සිදු කරගෙන යාමේ දී ඉහත කාල සීමාවෙන් ආවරණය නොවන හෝ ඉහත සඳහන් ක්‍රියා වලට පරිබාහිර එහෙත් පරීක්ෂණ කොමිෂන් සභාවට බරපතල ස්වභාවයේ බවට හැඟී යන වරදක් හෝ වැරදි සම්බන්ධයෙන් මහජන පැමිණිලි, තොරතුරු සහ සෙසු කරුණු කැඳවීම හා ලබා ගැනීම.

2. ඉහත කී 1 වැනි ඡේදයේ සඳහන් පැමිණිලි, තොරතුරු සහ චෝදනා පිළිබඳව කඩිනම් අපක්ෂපාති පුළුල් විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම.

3. එබඳු වරදවල්, වැරදි ක්‍රියාවන් සහ බලය හෝ අධිකාරිය, රාජ්‍ය සම්පත් සහ වරප්‍රසාද අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ අවභාවිතය සිදු කිරීම සම්බන්ධයෙන් නීති ප්‍රකාරව වගකිවයුතු වන පුද්ගලයන් හෝ ආයතන හඳුනා ගැනීම.

4. පූර්වෝක්ත 1 වැනි ඡේදයේ සඳහන් එබඳු වරදවල් හා වැරදි ක්‍රියාවන් පිළිබඳව සහ එබඳු සිද්ධීන්ට සහ වැරදි ක්‍රියාවන්ට අදාල වූ වරදවල් සිදුකර තිබීම පිළිබඳව වගකිවයුතු පුද්ගලයන් සහ ආයතන වලට එරෙහිව ලබා ගත හැකි සාක්ෂි හඳුනා ගැනීම හා එක්රැස් කිරීම.

5. ඉහත කී වරදවල් සිදුකරන ලදැයි කියනු ලබන පුද්ගලයින් සහ ආයතනවලට එරෙහිව සාපරාධී නීති කෘත්‍ය ඇරඹීමේ අරමුණින් අවශ්‍ය විමර්ශන හා පරීක්ෂණ කටයුතු පැවැත්වීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලීසියට හෝ වෙනත් නීති බලාත්මක කිරීමේ අධිකාරියකට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ඉදිරිපත් කල යුත්තේ ඉහත 1 වැනි ඡේදයේ සඳහන් කරුණු ගණයට ඇතුලත් ක්‍රියාවලින් කවර ඒවාදැයි හඳුනා ගැනීම.

6. ඉහත කී වරදවල් සිදුකර ඇතැයි කියනු ලබන පුද්ගලයන් සහ ආයතනවලට එරෙහිව සාපරාධී නීති කෘත්‍ය ඇරඹීම පිළිබඳව සලකා බැලීම සහ චූදිතයන්ට නඩු පැවරීමට නීතිපතිවරයාට අවකාශ සලසනු පිණිස විමර්ශන සහ පරීක්ෂණ පාදක කරුණු නීතිපතිවරයාට ඉදිරිපත් කිරීම.

7. වරදවල් හා වැරදි ක්‍රියාවන් සිදු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තන් සහ ආයතනවලට එරෙහිව ගතයුතු යම් ක්‍රියාමාර්ග වෙතොත් ඒ පිළිබඳ කොමිසමේ නිර්දේශ සහ එබඳු වරදවල් සහ වැරදි ක්‍රියාවන් ඉදිරියේ දී සිදුවීම වළක්වාලීමේ අරමුණින් කරනු ලබන නිර්දේශ මා වෙත ඉදිරිපත් කිරීම.

තවද, පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් ඉහත කී හිටපු මහාධිකරණ විනිසුරු නීතිඥ පියසේන රණසිංහ මැතිතුමා වන ඔබ මෙයින් පත් කරමි.

තවද, පෙර කී කරුණු සම්බන්ධයෙන් අවශ්‍යයැයි ඔබට පෙනී යා හැකි සාපරාධී හා ව්‍යවහාරික විමර්ශන පැවැත්වීමට හෝ බලපැවැත්වීමට සලස්වාලීමට සහ සියලුම ප්‍රසිද්ධ සහ /හෝ රහස්‍ය විමර්ශන හෝ පරීක්ෂණ කිරීමටද ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබතුමන්ලාට මා මෙයින් බලය හා අධිකාරය පවරන අතර, මේ අධිකාරී පත්‍රයෙහි දින සිට තෙමසක් (මාස 03) ඇතුලත පළමුවැනි අතුරු වාර්තාව ද ඊට අනතුරුව මසකට (මාස 01) වරක් අතුරු වාර්තා ද මෙහි සඳහන් දින සිට හය මසක් (මාස 06) ඇතුලත ඔබේ විමර්ශනයන්හි සහ පරීක්ෂණයන්හි නිගමනයන් හා ඒවාට අදාල ඔබේ නිර්දේශයන් ඇතුලත් අවසන් වාර්තාව ද ඔබේ අත්සනින් මා වෙත ඉදිරිපත් කරන මෙන් ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, පූර්වෝක්ත කාරණා වලට අදාළ වන කිසියම් විමර්ශනයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම් එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යැයි මම ඔබට නියම කරමි.

තවද, ඔබගේ විමර්ශනයන්හි හෝ පරීක්ෂණයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් ව්‍යවස්ථාපිත මණ්ඩල වල නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් තත්කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතුයැයි සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතු යැයිද මෙයින් නියම කොට විධාන කරමි.

තවද, ඉහත කී පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියෙහි විධිවිධාන මෙම කොමිෂන් සභාවට අදාල විය යුතු බව මම මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසිපහක් වූ දෙසැම්බර් මස 30 වැනි දින වන මෙදින කොළඹ දී දෙන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ආචාර්ය **එන්. එස්. කුමානායක,**
ජනාධිපති ලේකම්.

EOG - 12 - 0264

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.